(46)

(113)

# සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

Ministry of Finance, Economic Stabilaization & National Policies

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 13. 07. 2023 |
|---|---|---|---|---|---|

සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත,

<u>බැංකු ගිණුමක් නොමැති අස්වැසුම ප්‍රතිලාභීන් වෙත නව බැංකු ගිණුම් විවෘත කිරීම</u>

බැංකු ගිනුමක් නොමැති හෝ ක්‍රියාකාරි වලංගු බැංකු ගිණුමක් ඇති බව තහවුරු කරගෙන නොමැති සුදුසුකම්ලාභීන් වෙත බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා රාජ්‍ය බැංකු වෙත ලිපි නිකුත් කිරීමට ඔබ වෙත උපදෙස් ලබාදී තිබුණි.එහෙත් අභියාචනා සහ විරෝධතා බාර ගැනීම අවසන් වන තෙක් එම ලිපි නිකුත් කිරීම අත්හිටුවන ලෙසද පසුව උපදෙස් නිකුත් කරන ලදි. තවද අභියාචනා සහ විරෝධතා ඇතුළත් කිරීම අදින් අවසන් වන හෙයින් ඉන් පසුව විරෝධතා ඉදිරිපත් වූ සුදුසුකම්ලාභීන් හැර අනෙකුත් සුදුසුකම් ලාභීන් වෙත (බැංකු ගිණුම් විවෘත් කිරීමට අවශ්‍ය) නව බැංකු ගිණුම් විවෘත කරන ලෙසද පසුව උපදෙස් ලබාදෙන ලදි.

මේ අතර ඔබ විසින් ලිපියක් නිකුත් කිරීමකින් තොරව සුදුසුකම් ලාභීන් විසින් ස්වෙච්ඡාවෙන් ගිණුම් විවෘත කර විස්තර ඉදිරිපත් කළ අවස්ථාවන්ද ඇති බව අණාවරණය වී ඇත. ඒ අතර වලංගු නොවන බැංකු වලින් තහවුරු කර නොගත් ඔවුන්ගේ පැරණි ගිණුම්ද තිබිය හැක. කෙසේ නමුත් මේ පිළිබඳව බැංකු සමග කරන ලද සාකච්ඡා අනුව මෙවැනි ගිණුම් වල වලංගු භාවය පිළිබඳව එකින් එක මෙම අවස්ථාවේදී පරික්ෂා කිරීමගැටළු සහගත වේ. එමෙන්ම අදාළ රාජ්‍ය බැංකු විසින් අස්වැසුම වැඩසටහන සඳහා වෙනම විශේෂිත ගිණුම් විවෘත කිරීමට පියවර ගෙන ඇත. එම ගිණුම් සම්බන්ධයෙන් තොරතුරු පරිගනක පද්ධතිය තුළින් වාර්තා කිරීමට මෙහෙයුම් වැඩසටහනක්ද පිලියෙළ කර ඇත. එබැවින් එසේ ඔබේ ලිපි භාවිතා කිරීමකින් තොරව ස්වෙච්ඡාවෙන් විවෘත කළ බැංකු ගිණුම් මේ සඳහා යොදා ගත නොහැකි බව දන්වා සිටිමි.

එසේ හෙයින් එවැනි පුද්ගලයින් සඳහා විරෝධතා ගොනුකොට නොමැති නම් නව බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා අදාළ ලිපි නිකුත් කිරීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

ආර්.පී.ආර්. රාජපක්ෂ
අතිරේක කොමසාරිස් (මෙහෙයුම්)
කොමසාරිස් වෙනුවට

පිටපත - සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ.ගැ.පි.


කාර්යාලය / அலுவலகம் Tel: 009411- 2151481 009411- 2484600/4117 | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் welfarebenefitboard2016@gmail.com | වෙබ් අඩවිය / இணையதளம் www.wbb.gov.lk